| විභාග අංකය : |
|---|
| ....................................... |

# රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

## දීප ව්‍යාප්ත භාෂා පුහුණු වැඩසටහන

## අවසාන පරීක්ෂණය 2008

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි. | |
|---|---|
| ප්‍ර.අංක | ලකුණු |
| 1. | |
| 2. | |
| 3. | |
| එකතුව 100% | |
| 30 % | |

**සිංහල භාෂාව I මට්ටම (නව නිර්දේශය)**

**ප්‍රශ්න පත්‍ර අංක 1**

**2008.09.27**

**කාලය පැ තුනයි**

**ලකුණු 30යි**

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

1. පහත සඳහන් (i),(ii),(iii),(iv) හා (v) යනුවෙන් දැක්වෙන විස්තර අතුරින් එකක් තෝරා ගෙන ඒ යටතේ වචන 300 ක් පමණ වන සේ රචනයක් ලියන්න. අදාළ විස්තර මගින් කෙරෙන්නේ මග පෙන්වීමක් පමණකි. ඔබගේ රචනයට මාතෘකාවක් දෙන්න. ඔබගේ පිළිතුරු පතෙහි, දී ඇති අදාළ විස්තරයේ අංකය පැහැදිලිව සඳහන් කරන්න.

(i) අයිතිවාසිකම් හා ප්‍රතිලාභ ලබා ගැනීම පිණිස රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ සේවකයන් වැඩවර්ජනය කිරීමෙන් සිදු වන්නේ ජාතික ආර්ථිකය පිළිබඳ පරිහානියකි. එබැවින් සේව්‍ය - සේවක දෙපක්ෂය අවබෝධයක් සහිතව සාකච්ඡා කොට ගැටලු විසඳා ගැනීම ඉතා ප්‍රඥා ගෝචරය.

(ii) ඉන්ධන මිල වැඩිවීම, අද ලෝකයේ පවත්නා ඉතා බැරෑරුම් ගැටලුවයි. එය මානව සමාජයේ ප්‍රගතියට දැඩි බලපෑමක් ඇති කරයි. විකල්ප බලශක්ති ප්‍රභව පිළිබඳ සැලකීම ද මෙහි දී අනිවාර්ය වෙයි. කවර ආකාරයකින් හෝ මෙම ගැටලුව සාධනීය ආකාරයකින් විසඳා ගත යුතුය.

(iii) ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවය වැඩි දියුණු කිරීම රාජ්‍ය අංශය මගින් පමණක් කිරීම ඉතා දුෂ්කර වෙයි. පෞද්ගලික අංශයේද සහාය ඒ සඳහා ක්‍රමවත්ව ලබා ගත යුතු වෙයි. ඒ සඳහා උචිත පාලනයක් ද අවශ්‍ය ය.

(iv) ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය වශයෙන් පැන නගින අවශ්‍යතා පිළිබඳ විවිධත්වයක් ඇත. එම අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම පිණිස පළාත් සභා සහ ප්‍රාදේශීය සභා මගින් සිදුවන්නේ මහඟු සේවයකි. බලය බෙදා හැරීමේ අදහස ද මේ මගින් ඉටු කර ගත හැකිය.

(v) රජයේ වැඩි අවධානය යොමුව ඇත්තේ පාසැල් අධ්‍යාපනය සහ විශ්ව විද්‍යාල අධ්‍යාපනය කෙරෙහිය. කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය කෙරෙහි එවැන්නක් සිදු වී ඇතැයි නොපෙනේ. තරුණ පරපුරේ විරැකියාවත්, ශ්‍රම බලකායේ හිඟයත් පිළිබඳ ගැටලුව විසඳීමට කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය දියුණු කළ යුතුය.

2. පහත දැක්වෙන අංශවලින් එක් අංශයක් පිළිබඳ උසස් නිලධාරියෙකුට යැවෙන වාර්තාවක් හෝ පවත්වන ලද රැස්වීමක වාර්තාවක් හෝ පරීක්ෂණ වාර්තාවක් හෝ ලියන්න.

(i) පාඨශාලා ආචාර්යවරුන්ගේ වැටුප් විෂමතා පිළිබඳව මෙන්ම සේවය පිළිබඳව ද ගැටලු පහළ ව ඇත. එය මුළු මහත් අධ්‍යාපන පද්ධතියට ම බලපෑම් කර ඇත. වෘත්තීය සමිති මගින් මේ පිළිබඳ කරුණු පැහැදිලි කර ඇති අතර එම කරුණු ඇතුළත් කරමින් අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාට යැවීම පිණිස ලිපියක් ලියන්න.

(ii) විදුලිබල මණ්ඩලයේ අවධානය අවශ්‍ය පරිදි නොලැබීම නිසා, ඔබ ප්‍රදේශයේ විදුලිය පිළිබඳ වෙනස්කම් නිතර සිදුවේ. ඔබගේ විදුලි උපකරණවල ක්‍රියාකාරීත්වය පිළිබඳවද එය බලපෑම් ඇති කරයි. මාර්ග ආලෝක කිරීම ද අඩාල ව ඇත. මේ පිළිබඳ ප්‍රදේශවාසීන්ගේ රැස්වීමක් පැවැත් වූ අතර, විදුලිබල මණ්ඩලයට යැවීම පිණිස එහි වාර්තාවක් සකසන්න.

(iii) පෞද්ගලික අංශයේ ඇඳුම් කර්මාන්ත ශාලාවක සේවකයන්ගේ වැඩ වර්ජනයක් ඇති වී තිබේ. වේතන, පාරිතෝෂික දීමනා, අතිකාල දීමනා, සහ අර්ථසාධක අරමුදල් පිළිබඳ ගැටලු පහළව ඇත. කම්කරු අමාත්‍යාංශය මගින් ඔබ මේ සඳහා පරීක්ෂා කිරිමට පත් කර ඇත. ඒ පිළිබඳ අවශ්‍ය වාර්තාව පිළියෙල කරන්න.

(iv) පොදු ප්‍රවාහන අංශයේ පැන නැගී ඇති ගැටලු ඉතා බහුලය. දුම්රිය සේවය සහ බස්රිය සේවය ඉතා දුබල තත්ත්වයක පවතී. මෙය සොයා බැලීමට කමිටුවක් රජය මගින් පත් කරනු ලැබ ඇති අතර, ඔබ එහි ලේකම්වරයාය. එම කමිටු වාර්තාව සකසන්න.

(v) පරිසර දූෂණය ඉතා බලවත්ය. එය පාලනය නොකළ හොත් මහජන සෞඛ්‍යය පිළිබඳ දැඩි බලපෑමක් ඇති වේ. ඒ සඳහා මහජන සහයෝගය ද ඉතා අවශ්‍යය. එය ලබා ගැනීම පිණිස රාජ්‍ය නිලධාරියෙකු වශයෙන් ලේඛනයක් සකස් කරන්න.

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

3. පහත සඳහන් පාඨය වචන 60 ක් පමණ වන සේ සාරාංශ කොට ලියා ඊට සුදුසු මාතෘකාවක් ද යොදන්න. ඔබ විසින් යොදනු ලැබූ වචන සංඛ්‍යාව සාරාංශයේ අග සටහන් කරන්න.

නියම ගුරුවරයා යනු ශිෂ්‍යයන්ගේ සහ දෙගුරුන්ගේ මෙන්ම ජන සමාජයේ ද නිරන්තර ගෞරවයට පාත්‍ර වන උතුම් පුද්ගලයෙකි. මීට දශක කිහිපයකට ප්‍රථම ගමේ පාසැලේ ආචාර්යවරයාට හිමි ව තිබූ තැන පිළිබඳව මෙනෙහි කිරීම පවා සතුටට කරුණකි. ඔවුන් ආර්ථීක ප්‍රයෝජන පිළිබඳ නොසලකා ශිෂ්‍යයන්ගේ සහ තම පාඨශාලාවල දියුණුව සඳහා ක්‍රියා කළ ආකාරය, අද පවා මෙරටේ වැඩිහිටි පරපුර ඉමහත් භක්තියෙන් හා ගෞරවයෙන් යුක්තව සිහි කරති.

තත්ත්වය එසේ වුව ද, වර්තමාන ගුරුවෘත්තිකයන්ට ඒ ගෞරවය සමාජයෙන් ලැබෙන්නේ නැත. එහි ගෞරවය රැක ගැනීම පිළිබඳ දුෂ්කරතා ඔවුන්ට ඇත. ඔවුහු දැන දැනම අනවශ්‍ය දේශපාලන සම්බන්ධතා පවත්වා ගනිමින් ගැටලු නිර්මාණය කර ගනිති.

මෙරටට අවශ්‍ය වනුයේ බාහිර පුද්ගලයන් විසින් ක්‍රියා කරවනු ලබන ගුරුපරපුරක් නොවේ. සිය අභිමානය, ගරුත්වය මෙන්ම තමන්ට පැවරී ඇති ජාතික මෙහෙවරෙහි වටිනාකම ද මනාසේ වටහා ගත් ආචාර්ය පිරිසකි. නමුත් ජාතියේ අවාසනාවට මෙරටින් අභාවයට යන්නේ ද එවැන්නකි. මේ තත්ත්වය තුළ රටේ දරු පරපුරේ අනාගතය කෙරෙහි එල්ල වී ඇති අනතුරු සංඥාව ඉතා බලවත්ය. මේ අනුව නම් අනාගතයෙහි දී මෙරටෙහි පැවැතිය යුත්තේ දැඩි විනය පද්ධතියක් තුළ ක්‍රියාත්මක වන ගුරුසේවයක් බව සඳහන් කළ යුතුමය. පෙර කල තිබූ ස්වයං විනය යන්න, දැන් ඔවුන් බොහෝ දෙනෙකු තුළ නොපවතී. ඇති වී තිබෙන වෘත්තීය පරිහානියට ද හේතු වී ඇත්තේ ද මෙය මය. මෙය නිලධාරින්ගේ හා පාලකයන්ගේ අවධානයට යොමු විය යුතුය.

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................